# දකුණු පළාත් සභාව
# ප්‍රධාන අමාත්‍යාංශය
## ලංසු සඳහා ආරාධනාවයි

දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපති, මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ජංගම රසායනාගාර බස් රථයක් නිර්මාණය කර සැපයීම සඳහා යෝග්‍ය හා සුදුසුකම් සහිත ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ලංසුව පිළිබඳ විස්තරය | මිලදී ගනු ලබන ප්‍රමාණය | ආපසු නොගෙවන ලංසුපත් ගාස්තු(රු) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණය (රු) | අරමුදල් ප්‍රභවය |
|---|---|---|---|---|
| Design and Supply Mobile Laboratory Bus for Regional Director of Health Service Office – Matara. | 01 | 12,500.00 | 100,000.00 | ලෝක බැංකුව |

01. ලංසුපත් 2023.08.07 දින සිට 2023.08.25 දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා 05 වන මහළ, දක්ෂිණපාය, ලබුදූව,ගාල්ල යන ස්ථානයේහි ස්ථාපිත දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයීය ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය. වැඩිදුර තොරතුරු අමාත්‍යාංශයේ මෙම අංකයට වැඩකරන දින ඇමතීමෙන් ලබාගත හැකිය. 091-4946604

02. ජාතික තරඟකාරී ලංසු පටිපාටිය මත ලංසු ඉදිරිපත් කල යුතු අතර කොන්ත්‍රාත් ප්‍රදානයේදී සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරුවන් අසාධු ලේඛනගත නොවිය යුතුය.දැනට මේ සම්බන්ධයෙන් බලාත්මක චක්‍රලේඛ හා ලංසු ලියකියවිලි සඳහන් කර ඇති අවශ්‍යතාවයන් පිළිබඳ ලංසු ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

03.ලංසුව සමඟ ඉදිරිපත් කරනු ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් “දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්” නමට 2023.08.28 දින සිට 2023.12.11 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ ප්‍රධාන අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබා දෙන කුවිතාන්සිය ලංසු පත්‍රිකා සමඟ ඉදිරිපත් කල යුතුය.වෙක්පත් ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04.ඉදිරිපත් කරනු ලබන ලංසුපත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතු අතර එහි මුල් පිටපතෙහි “මුල් පිටපත” යනුවෙන් සඳහන් කල යුතු අතර අනුපිටපතෙහි “අනුපිටපත” යනුවෙන් සඳහන් කල යුතුය.ලංසුපත්වල මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරයද මුද්‍රා තබා ඉදිරිපත් කල යුතුය.

05.සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා 2023.08.28 වන දින ප.ව.2.00 ට ප්‍රථමයෙන් ලැබෙන සේ “ලේකම් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය 5 වන මහළ, දක්ෂිණපාය, ලබුදූව,ගාල්ල” යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ප්‍රධාන අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත භාර දිය හැකිය.ප්‍රමාද වී ලැබෙන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කෙරේ.

06.ලංසුපත් විවෘත කිරිම 2023.08.28 වන දින ප.ව.2.00ට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ හෝ ඔහු විසින් බලය පවරන නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේදී සිදු කරන ලබන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලය ලත් නියෝජිතයන් හට සහභාගි විය හැක.

07.ලංසු වලංගු කාලය 2023.11.13 දක්වා වේ.

08.පූර්ව ලංසු රැස්වීම 2023.08.14 දින ප.ව.2.00ට Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට නියමිතය. අදාල සැබැඳීය ලංසු පත්‍රිකා ලබා ගැනිමේදී ලබාදීමට කටයුතු කරනු ලැබේ.

09.අඩුපාඩු සහිත ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලබාගෙන ලංසු ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ ලංසු ඇප මුදල් රාජසන්තක කරනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසාන තිරණය බව සැලකිය යුතුය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන අමාත්‍යාංශය - දකුණු පළාත,
5 වන මහළ, දක්ෂිණපාය,ලබුදූව,ගාල්ල.
2023.08.07